JMC vLearning
"your virtual learning partner"

# ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය, එහි බලය හා කාර්යභාරය

## AAT අදියර II

### BLA - ව්‍යාපාර නීතිය


කපිල ජයසිංහ
LL.B (UOC), Post graduate diploma in Human rights law (IHR),
Attorney at Law



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

පරිච්ඡේදය 6

# ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය හා ඒවායේ බලතල
# THE COURT SYSTEM OF SRI LANKA & ITS POWERS

**ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය**

**ඉහළ අධිකරණය**
**Superior Court**

(i) ශ්‍රේෂ්ඨාධිකරණය (Supreme Court)
(ii) අභියාචනාධිකරණය (Court of Appeal)

**පහළ අධිකරණය**
**(මුල් අවස්ථා අධිකරණය)**
**Preliminary Court**

(i) ප්‍රාථමික අධිකරණය (Primary Court)
(ii) මහේස්ත්‍රාත් අධිකරණය (Magistrate Court)
(iii) දිසා අධිකරණය (District Court)
(iv) මහාධිකරණය (High Court)

මෙරට අධිකරණ පද්ධතිය පිළිබඳව සලකා බැලීමේදී 1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනත වැදගත් වේ. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් වු 13 වන සංශෝධනය ද ඒ යටතේ ඇති කරන ලද 1990 අංක 19 දරණ පළාත් බද මහාධිකරණ විශේෂ විධිවිධාන පනත ද 2006 අංක 54 දරණ පළාත් බද, මහාධිකරණ විශේෂ විධිවිධාන පනත ද වැදගත් වේ. මීට අමතරව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 1979 අංක 44 දරණ ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ අධිකරණ පද්ධතිය පිළිබඳව විධිවිධාන අඩංගු වේ.

## මුල් අවස්ථා අධිකරණ / ප්‍රාථමික අධිකරණය

1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනත අනුව මෙරට යුක්තිය පසඳලීම සඳහා පහත දැක්වෙන මුල් අවස්ථා අධිකරණ ක්‍රියාත්මක වේ.

### ප්‍රාථමික අධිකරණය

මෙරට අධිකරණ පද්ධතියේ පහළම අධිකරණය මෙයයි. මෙහිදී ආරවුල් ගත පාර්ශවයන් අතර කිසියම් එකඟතාවයක් ඇති කිරීමට ප්‍රාථමික විනිශ්චයකාරවරුන් උත්සාහ දරයි. අධිකරණ සංවිධාන පනතට අනුව පහත දැක්වෙන වැරදි. සම්බන්ධව නඩු විභාග කිරීමේ බලය ප්‍රාථමික අධිකරණයට ඇත.

1. අලාභ ඉල්ලීම, හිමිකම් කියාපෑමට හෝ ගෙවීම් පැහැර හැරීමට වටිනාකමින් රු. 1,500 අඩු ණය සහ අලාභ ඉල්ලීම් සම්බන්ධ මුල් සිවිල් අධිකරණ බලය.
2. සුළු සිවිල් සහ සුළු අපරාධ නඩු.
3. පළාත් පාලන ආයතනවල අනු නීති ක්‍රියාත්මක කිරීම හා එම ආයතනවල ආදායම් ලබාගැනීම සම්බන්ධ නඩු.
4. ඉඩම් ආරවුල් සම්බන්ධ වැරදි.

මේ යටතේ 1979 අංක 44 දරණ ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තියට අදාළ නඩු විභාග කිරීමේ බලය. මෙහිදී ඉඩමක වැට මායිම් හෝ භුක්තිය පිළිබඳ ප්‍රශ්නයක් නම් එම ආරවුල් දෙපාර්ශවය අතර සාමය කඩවීමේ තර්ජනයක් ඇති බවට පොලිසියට පෙනී යන්නේ නම්, එම දෙපාර්ශවයම වගඋත්තරකරුවන් ලෙස පත්කර ඉහත කී වගන්තිය යටතේ ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරයි.

- ප්‍රාථමික අධිකරණයක තීන්දුවෙන් අතෘප්තියට පත්වන පාර්ශවයට එම ප්‍රාථමික අධිකරණය පිහිටි ප්‍රදේශයේ පළාත් බද මහාධිකරණයට ප්‍රතිශෝධන ඉල්ලීමක් කළ හැක.

## මහේස්ත්‍රාත් අධිකරණය

මෙහිදී වඩා බරපතල නොවූ අපරාධ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය මහේස්ත්‍රාත් අධිකරණයට පවරා ඇත. අධිකරණ සංවිධාන පනතේ දැක්වෙන පරිදි පහත වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීමේ බලය මෙම අධිකරණයට ඇත.

(i) සුළු අපරාධ නඩු විභාග කිරීම.
උදා: **සුළු සොරකම්, තුවාල කිරීම්, නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය, රථ වාහන වැරදි**

(ii) ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම.
උදා: **මිනිමැරීම්, මිනිමැරීමට තැත් කිරීම්, ස්ත්‍රී දූෂණ යන වැරදි පිළිබඳව නඩු විභාග කිරීම සඳහා මහාධිකරණයට යොමු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබේද, නැද්ද යන්න සොයා බැලීම මෙහිදී සිදුවේ.**

(iii) ස්ථාන සෝදිසි කිරීමේ වරෙන්තු නිකුත් කිරීම. (Search Warrant)

(iv) පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු නිකුත් කිරීම.

(v) හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම (Inquest)

(vi) බලය ඇති වැරදි සම්බන්ධයෙන් සැකකරුවන්ට ඇප නියම කිරීම.
උදා: **ස්ත්‍රී දූෂණ, මිනිමැරීමට තැත් කිරීම**

(vii) මහජන පීඩා පිළිබඳ අපරාධ නඩු සම්බන්ධ සංග්‍රහයේ 98 වන වගන්තිය යටතේ පරීක්ෂණ පවත්වා සුදුසු නියෝග කිරීම්.
උදා: **පළාත් පාලන ආයතන මගින් නිසි පරිදි කසල ඉවත් නොකිරීම, අනතුරුදායක තාප්ප, ගස් කපා ඉවත් නොකිරීම වැනි වැරදි**

(viii) හඳුනා ගැනීමේ පෙරෙට්ටු පැවැත්වීම (Identification Parade)
කිසියම් අපරාධයක් සිදු වූ විට එය හරිහැටි හඳුනා ගැනීමට නොහැකි වූයේ නම්, එය නිශ්චය කර ගැනීම සඳහා මෙය පවත්වයි.

(ix) සේවක අර්ථසාධක අරමුදල් (EPF) හා සේවක භාරකාර අරමුදල් (ETF) වල හිඟ මුදල් අයකර ගැනීමේ නඩු.

(x) කම්කරු විනිශ්වය සභාවල නඩු විනිශ්වය කිරීම.

(xi) කාති අධිකරණය (Quazi Court) වල නියෝග ක්‍රියාත්මක කිරීම.

(xii) නඩත්තු නඩු විභාග කිරීම.
මෙම බලය 1999 අංක 37 දරණ නඩත්තු පනත මගින් මහේස්ත්‍රාත් අධිකරණයට පවරා ඇත.

(xiii) බුද්ධිමය දේපළ පනත යටතේ නඩු විභාග කිරීම.

## දිසා අධිකරණය

සිවිල් ස්වභාවයේ නඩු පමණක් මෙහි විභාග කෙරේ. මෙහි විනිසුරුවරයා දිසාවිනිසුරු ලෙස නම්කරයි. දිසා විනිසුරුවරු පත්කරන්නේ අධිකරණ සේවා කොමිෂම මගිනි.

**දිසා අධිකරණයක බලතල :**

(i) දේපළ සම්බන්ධ නඩු කටයුතු
උදා: ඉඩම් නඩු, බෙදුම් නඩු, ගෙවල් කුලී නඩු, ඉඩමක හිමිකාරත්වය ප්‍රකාශ කිරීමේ නඩු, මාර්ග අයිතිය සම්බන්ධ නඩු, ඉඩම්වලට සම්බන්ධ පරවශතා (Servitudes)

(ii) ආදායම් තෙස්තමේන්තු (බූදල් නඩු හා භාර සම්බන්ධ නඩු)
වර්තමානයේ නීතියට අනුව රු. ලක්‍ෂ 40 වැඩි වටිනාකමක් ඇති බූදලයක් තබා මිය ගිය පුද්ගලයකු තම අන්තිම කැමති පත්‍රය තබා හෝ නොතබා මිය ගියහොත් මියගොස් මාස 03 ක් ඇතුලත නඩුවක් පවරා දේපළ උරුමකරුවන් අතරේ බෙදාගත හැකිය.

(iii) ගිවිසුම් සම්බන්ධ නඩු කටයුතු
උදා: හවුල් ව්‍යාපාර ගිවිසුම්, කුලී සින්නක්කර ගිවිසුම්, කල්බදු ගිවිසුම් සහ ණය ගිවිසුම් සම්බන්ධ නඩු.

(iv) දීලික්ත නඩු කටයුතු
උදා: නොසැලකිල්ල නිසා සිදුවන සාවද්‍ය හානි අපහාස නඩු, රිය අනතුරු වන්දි නඩු

(v) සමාගම් විසුරුවා හැරීමේ සහ වස්තු භංගත්වයට පත්වීම සම්බන්ධ නඩු

(vi) වෛවාහක ආරවුල් සම්බන්ධ නඩු
උදා: දික්කසාද නඩු, විවාහ ශූන්‍යතා නඩු

(vii) දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධ නඩු
බාල වයස්කරුවකුගේ ඉහළම භාරකරු ලෙස සලකන්නේ දිසා අධිකරණයටයි.

(viii) මන්ද බුද්ධික සහ උමතු තැනැත්තන්ගේ දේපළ සම්බන්ධයෙන් රැකවල්කරුවකු ලෙස ක්‍රියාකිරීම.

**දිසා අධිකරණයේ තහනම් ආඥා ලබාගැනීමට ඇති හැකියාව**

යම් පාර්ශවයක් විසින් තවත් පාර්ශවයකට එරෙහිව සිදුකරන නීති විරෝධි ක්‍රියාවක් නිසා බරපතල පාඩුවක් සිදුවන්නේ නම් සහ එම ක්‍රියාව වහාම නැවැත්වීම සඳහා එවැනි විටක එම ක්‍රියාවන් සිදු කිරීම වලක්වන වාරන ආඥා සහ අතුරු ඉන්ජන්ෂන් තහනම් ආඥා ලබාගත හැකිය.

**(1) වාරන ආඥා - (Enjoining Orders)**
මුල් අවස්ථාවේදීම ඒකපාර්ශවිකව කරුණු විමසා අදාළ නීතිවිරෝධී ක්‍රියාව දින 14 ක කාලයකට තහනම් කෙරෙන නියෝගයකි.

**(2) අතුරු ඉන්ජන්ෂන් ආඥාව - (Interim Injunction)**
දෙපාර්ශවයෙන්ම කරුණු විමසීමෙන් පසුව ප්‍රමාණවත් කරුණු ඇති විට නඩුවේ කටයුතු අවසන් වන තෙක් අදාළ ක්‍රියාවන් නැවැත්වීමට කටයුතු කරන නියෝගයකි.

**(3) ඉන්ජන්ෂන් තහනම**
මෙය නඩුවක් අවසානයේදී පමණක් දෙපාර්ශවයේම කරුණු සලකා බලා නිකුත් කරන නියෝගයකි.

- දිසා අධිකරණ තීන්දුවකින් අතෘප්තියට පත් පාර්ශවයට ඒ සම්බන්ධයෙන් එම දිසා අධිකරණයේ පිහිටි ප්‍රදේශයේ පළාත් බද සිවිල් අභියාචනා ඉදිරිපත් කළ හැක. එමෙන්ම නඩුවක් අතරතුර අතෘප්තියට පත් පාර්ශවයට ද මෙම අධිකරණයට ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය (Revision Application)

## මහාධිකරණය

මෙරට ක්‍රියාත්මක වන ඉහළම මුල් අවස්ථා අධිකරණයයි. මෙහි විනිසුරුවන් පත්කිරීම අධිකරණ සේවා කොමිසමේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලැබේ.

**මහාධිකරණයේ විභාග වන නඩු වර්ග:**

(i) මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝුනොවන පරීක්ෂණයකින් පසුව යැවෙන නඩු.
උදා: මිනී මැරීම, මිනීමැරීමට තැත් කිරීම, ස්ත්‍රී දූෂණ

(ii) මහාධිකරණය විසින් ඍජුවම විභාග කරන නඩු.
උදා: රාජද්‍රෝහී වීම, ඇතැම් අල්ලස් නඩු.

(iii) ජූරි සභාවක් සහිතව හෝ රහිතව නඩු විභාග කිරීමේ බලය.

(iv) මහජන කැළඹීමට හේතුවන ආකාරයේ අපරාධමය නඩුවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ ඉල්ලීම පිට අගවිනිසුරුතුමා විසින් පත්කරනු ලබන ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් (Trial at bar) ඉදිරියේ නඩු විභාග පැවැත්වීමේ බලය.
උදා: හෝකන්දර සය පුද්ගල ඝාතන නඩුව
අගවිනිසුරු සරත් අඹේපිටිය ඝාතන සම්බන්ධ නඩුව
සඳීප ලක්ෂාන් දරුවා පැහැර ගෙනගොස් ඝාතනය කිරීමේ නඩුව
ඉනෝකා සෙව්වන්දි සෙබලිය ඝාතන නඩුව
උඩතලවින්න දස පුද්ගල ඝාතන නඩුව

(v) අද්මිරාල්ති අධිකරණ බලය
මින් අදහස් කරන්නේ නැව් සහ නාවික කටයුතු සම්බන්ධ නඩු. මෙය සාමාන්‍යයෙන් කොළඹ මහාධිකරණය මගින් විභාග කෙරේ.

(vi) රු. මිලියන 3 කට වැඩි වටිනාකමකින් යුත් වෙළඳ කටයුතු පිළිබඳ නඩු හා බුද්ධිමය දේපළ වලට අදාළ නඩු විභාග කිරීමේ අයිතිය කොළඹ මහාධිකරණයට ඇත.

(vii) ඇප නියම කිරීම සහ හදිසි නීති රෙගුලාසි කඩ කිරීම සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය.

(viii) රජයේ ආයතනවල හෝ බලධාරීන්ගේ නීත්‍යානුකූල නොවන ක්‍රියාවන්ට එරෙහිව ලබාගත හැකි පරිපාලන නීති ප්‍රතිකර්මක් වූ රිට් (Writ Order) ආඥා කිසියම් පළාතක් තුළට පමණක් සීමාවන පරිදි නිකුත් කිරීමේ බලය.

(ix) 1990 පළාත්බද මහාධිකරණ විශේෂ විධිවිධාන පනත යටතේ පළාත තුළ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණයකින්, කම්කරු විනිශ්චය සභාවකින් හෝ ගොවිජන සේවා සභාවකින් නිකුත් කරනු ලබන නියෝගයකට හෝ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ඉදිරිපත් කිරීමේ බලය සහ එම නියෝග සම්බන්ධ ප්‍රතිශෝධන ඉල්ලීම් විභාග කිරීමේ බලය.

- පළාත් බද මහාධිකරණ තීන්දුවකින් අතෘප්තියට පත්වන පාර්ශවයට ඒ සම්බන්ධයෙන් අපරාධ නඩු වලදී **අභියාචනාධිකරණයට ද**, ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ විභාගවන නඩුවලට සහ වාණිජ මහාධිකරණයෙන් විභාග කරන නඩු සම්බන්ධයෙන් **ශ්‍රේෂ්ඨාධිකරණයට ද** අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

## ශ්‍රේෂ්ඨාධිකරණය

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන උත්තරීතර හා අවසානාත්මක උසාවිය ශ්‍රේෂ්ඨාධිකරණයයි. මෙයට හිමි බලතල 1978 2 වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120 - 131 දක්වා වගන්තිවල දැක්වේ. ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරු පත්කරන්නේ, පාර්ලිමේන්තු සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසිනි.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු ඉවත් කිරීමේ බලය ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරු සංඛ්‍යාවකින් දෝෂාභියෝග යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසු එය ජනාධිපතිවරයා වෙත යොමු කිරීමෙනි. එවිට ජනාධිපතිවරයා විසින් අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා ඉවත් කෙරේ.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලතල**

**(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ හැකියාව**

මින් අදහස් වන්නේ, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන්නේද, නැද්ද යන්න පිළිබඳව විමසා බලා තීරණය කිරීමයි.

**(ii) අවසාන අභියාචනා බලය**

මින් අදහස් වන්නේ වෙනත් අධිකරණවල විභාග කළ සියලුම සිවිල් හා අපරාධ නඩු සම්බන්ධයෙන් අවසාන අභියාචනා ඉදිරිපත් කළ හැකි එකම අධිකරණය ලෙස ක්‍රියා කිරීමයි. මෙහිදී දෙනු ලබන තීන්දු අවසානාත්මක වන අතර වෙනත් කිසිදු අධිකරණයකදී මෙය නැවත ප්‍රශ්න කළ නොහැකිය.

**(iii) උපදේශක අධිකරණ බලය**

ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ මතය විමසීම සඳහා යොමු කරනු ලබන කිසියම් නීතිමය හෝ සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට සිය මතය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැනුම් දීමයි.

**(iv) මූලික අයිතිවාසිකම් සම්බන්ධ නඩු විභාග කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 10 - 14 දක්වා වගන්ති වල මූලික අයිතිවාසිකම් කඩ කිරීමක්, විධායක හෝ පරිපාලක ක්‍රියාවකින් සිදුවී ඇතිවිට එම සිදුවීමෙන් මාසයක් ඇතුලත මෙරට පුරවැසියකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 හා 127 වගන්ති ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් වන මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කර ඒ සම්බන්ධ තීන්දු ලබාදීමේ බලයයි.

**(v) ජනාධිපතිවරණ හා ජනමත විචාරණ ඡන්ද පෙත්සම් විභාග කිරීමේ බලය**

ජනාධිපතිවරණයේදී හෝ ජනමත විචාරණයකදී මැතිවරණ දූෂණ හෝ වෙනත් අනුක්‍රමිකතා සිදු වී ඇතැයි පුරවැසියකු විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් විභාග කිරීමේ බලය ද ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත.

**(vi) පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය**

1953 පාර්ලිමේන්තු වරප්‍රසාද පනත අනුව එම වරප්‍රසාද කඩකරන පුද්ගලයන්ට එරෙහිව චෝදනා විභාග කොට වැරදිකරුවනට දඬුවම් පැනවීමේ බලය ඇත.

## අභියාචනාධිකරණය

මෙයට හිමි බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 - 145 දක්වා වගන්තිවල දැක්වේ. මෙහි විනිශ්චයකාරවරුන් පත්කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

**(i) අභියාචනා විභාග කිරීමේ බලය**

මුල් අවස්ථා අධිකරණය සහ වෙනත් විනිශ්චය සභා විසින් විභාග කොට අවසන් කරනු ලැබූ නඩු තීන්දු සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන පාර්ශවයන් ඉදිරිපත් කරන අභියාචන විභාග කිරීම මින් අදහස් වේ.

**(ii) ප්‍රතිශෝධන අධිකරණ බලය**

**(iii) රිට් ආඥා නිකුත් කිරීමේ බලය (Revisionary Jurisdiction)**

මින් අදහස් වන්නේ, රජයේ නිලධාරීන්ගේ ආයතන විසින් සිය බලතල ඉක්මවා යමින් හෝ ස්වභාවික යුක්ති මූලධර්මයට පටහැනිව ගනු ලබන තීරණ නිශ්ප්‍රභ කිරීම සඳහා සර්ෂියෝරාරි (Certiorari) රිට් ආඥා නිකුත් කිරීමේ බලය ද එවැනි ආයතන නොකර හරින නිත්‍යානුකූල ක්‍රියාවක් ඉටුකරවා ගැනීම සඳහා මැන්ඩාමුස් (Mandamus) ආඥා නිකුත් කිරීමේ බලයක්ද, කිසියම් පොදු ස්වභාවයේ නිලයකට නුසුදුසු පුද්ගලයකු පත් කළ විට එවැන්නකු ඉවත් කිරීමට ක්වෝ වොරොන්ටෝ (Quo Warranto) රිට් ආඥා නිකුත් කිරීමේ බලයත්, නීති විරෝධි ක්‍රියාවක් තහනම් කරන ප්‍රොහිබිෂන් (Prohibition) රිට් ආඥා හා නීති විරෝධි ලෙස රඳවා ගෙන සිටින පුද්ගලයකුව අධිකරණය වෙත පැමිණවීම සඳහා හබයාස් කෝපුස් (Heabeas Corpus) රිට් ආඥා නිකුත් කිරීමේ බලය ද ඇත.

**(iv) නඩුවක් යථාතත්ත්වයට පත් කිරීමේ බලය**

යම් නඩු විභාගයකදී සිදු කරන ලද වංචාවක් හෝ වෙනත් අකටයුත්තක ප්‍රතිඵලයක් වශයෙන් ලබාදුන් නඩු තීන්දුවකින් යමෙකුගේ අයිතිවාසිකම් වලට බලපෑමක් එල්ල වී ඇති විට අදාළ අයිතිවාසිකම් යථාතත්ත්වයට පත්කිරීමට මෙම බලය භාවිතා කරයි.

**(v) ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමේ බලය (Injunction Orders)**

කිසියම් පාර්ශවකරුවකුට තමාගේ දේපළ වලට හානියක් සිදුවන ආකාරයට යම් නීතිවිරෝධි ක්‍රියාවක් තවත් පුද්ගලයකු විසින් සිදුකරන විට එය තහනම් කෙරෙන ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කිරීමේ බලය ඇත.

**(vi) පාර්ලිමේන්තු මැතිවරණ හා පළාත් පාලන මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය**

ඉහත කී මැතිවරණ වලදී කිසියම් ඡන්ද දූෂණයක් වෙනත් යම් අක්‍රමිකතාවක් සිදු වී ඇතැයි යමෙකු පෙත්සම් ඉදිරිපත් කළහොත් එය විභාග කිරීමේ බලය මෙයට ඇත.

**(vii) අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ නඩු විභාග කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) ව්‍යවස්ථාව අනුව අධිකරණයට අපහාස කිරීමේ නඩු අභියාචනාධිකරණයේදී විභාග කෙරේ.

**(viii) නඩු මාරු කිරීමේ බලය**

1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතේ 46 වන වගන්තිය අනුව නඩු නිමිත්ත හටගත් ප්‍රදේශයේ අධිකරණයක නොව වෙනත් අධිකරණයක නඩුව විභාග කර ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා නඩු මාරු කිරීමේ බලය (පාර්ශවකරුගේ ඉල්ලීම පිට) අභියාචනාධිකරණයට ඇත.

**(ix) නඩු වාර්තා කැඳවීමේ බලය**

යම් තැනැත්තකු විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව හෝ සිය මෙහෙයවීමෙන්ම ඕනෑම මුල් අවස්ථා අධිකරණයක වාර්තා ගෙන්වා ගැනීමටත්, සෝදිසි කිරීමටත්, පරීක්ෂා කිරීමටත් පසුව සුදුසු ආඥා නිකුත් කිරීමටත් බලය ඇත.

**(x) සැකකරුවන්ට ඇප ලබාදීමේ බලය**

වෙනත් නීතියක කුමක් සඳහන් වුවද අපරාධ නඩු විධාන සංග්‍රහයේ 404 වගන්තිය යටතේ සැකකරුවන් සඳහා අභියාචනාධිකරණයට ඇප ලබාදිය හැකිය.